පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 13

# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය : ලංකා ඉතිහාසය I (I කොටස) | 25 | S | I |

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................  කාලය :

| | | | | |
|---|---|---|---|---|
| 1) 05 | 2)04 | 3)01 | 4)02 | 5)05 |
| 6)05 | 7)01 | 8)02 | 9)03 | 10)04 |
| 11) 03 | 12)03 | 13)04 | 14)03 | 15)02 |
| 16)04 | 17)04 | 18)04 | 19)04 | 20)02 |
| 21) 05 | 22)05 | 23)03 | 24)04 | 25) |
| 26) 05 | 27)02 | 28)01 | 29)03 | 30)05 |
| 31) 01 | 32)01 | 33)04 | 34)04 | 35)04 |
| 36) 04 | 37)02 | 38)05 | 39)05 | 40)05 |

| ශ්‍රේණිය |
|---|
| 13 |


# තෙවන වාර පරීක්ෂණය - 2023

විෂයය :- ලංකා ඉතිහාසය I (II කොටස) | 25 | S | II |

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................. කාලය :

## A කොටස



## B කොටස

**i)** මධ්‍යම කඳුකරය

- ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය හැඩගැස්වීමෙහි ලා දිවයින මධ්‍යයේ, ප්‍රවේශ වීමට දුෂ්කර කඳුකර ප්‍රදේශයක් පිහිටීම තීරණාත්මක ලෙස බලපා තිබීම.
- එම ප්‍රදේශය ගිරිදුර්ග, ජලදුර්ග, වනදුර්ග ආදියෙන් ආරක්ෂා වී තිබීම හේතු කොටගෙන විදේශ ආක්‍රමණ හා සිවිල් අරගල අවසථා වලදී ආරක්ෂිත ස්ථානයක් ඉවට පත් වීම.
- මුල් යුගයේ සිටම රජවරුන් විදේශිය ආක්‍රමණ හමුවේ මෙම කලාපය අභය ස්ථානයක් වශයෙන් තෝරා ගැනීම.
  ex:- දකුණු ඉන්දීය ආක්‍රමණ හමුවේ වට්ටගාමිණී අභය, I සේන හා I විජයබාහු වැනි පාලකයන්.
- සෙසු ප්‍රදේශ වල දේශපාලන ආරවුල් අවස්ථා වලදී රාජ උදහසට ලක්වූ පුද්ගලයන් ආරක්ෂාව පතා මෙම ප්‍රදේශයට පලා යාම.
  ex:-කාවන්තිස්ස රජුගේ උදහසට ලක්වූ දුටුගැමුණු කුමරා, II සංඝතිස්ස රජුගේ පුත් ජෙට්ඨතිස්ස කුමරා, II මහින්ද රජුට විරුද්ධ වූ ආදිපාද දප්පුල, II සේන රජුගේ උදහසට ලක් වූ මහාදිපාද මහින්ද.
- ක්‍රමයෙන් වෙනම දේශපාලන ඒකකයක් නිර්මාණය වීම හා රාජධානි බිහිවීම. (ගම්පොළ, මහනුවර)
- මෙම ප්‍රදේශයේ පිහිටීම හා ස්වභාවික බාධක හේතු කොට ගෙන විදේශ ආක්‍රමණයන්ට විශේෂයෙන්ම පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට (1803 දී ඉංග්‍රීසීන්ට) උඩරට රාජධානිය යටත්කර ගත නොහැකි වීම.
- 1817/18 සහ 1848 යටත් විජිත විරෝධී ප්‍රතිරෝධ ව්‍යාපාර වල මූලස්ථානය වීම.
- ලංකාවේ ගංගා පද්ධතිය ආරම්භ වන කලාපය වීම.
- මෙරට සමාජ, ආර්ථික හා සංස්කෘතික ඉතිහාසයේ කැපී පෙනෙන වෙනස් වීම් සඳහා හේතු වූ වතු වැවිලි ආර්ථිකය ආරම්භ වූ කලාපය වීම.
- දළදා මාලිගාව මහනුවර ඉදිවීමත් සමග මෙරට ආගමික හා සංස්කෘතික ඉතිහාසයෙහි ලා වැදගත් කලාපයක් බවට පත් වීම.

**ii)** ගංගා සහ ගංගා නිම්න

- මධ්‍ය කඳුකරයේ සිට දිවයිනේ සෑම දිශාවකටම ගලා බසින වර්ෂය පුරා අඛණ්ඩව ජලය රැඳී ගංගා පද්ධතියක් හා පළල් නිම්න සහිත ගංගා ද්‍රෝණි තිබීම, මුල් ජනාවාස පිහිටුවීමහ හා ඒවායේ ව්‍යාපෘතියට බලපෑම. (ගංගා ඔස්සේ රට අභ්‍යන්තරයට ජනාවාස ව්‍යාප්ත වීම)
  ex:- මල්වතු ඔය - අනුරාධගාම/ තම්බපණ්ණි නගරය, කලා ඔය - උරුවේලගාම/ විජිතගාම, කනදරා ඔය - උපතිස්සගාම, ගල් ඔය - දීඝගාම
- රාජධානි වල අගනුවර ගංගාශ්‍රිතව බිහිවීම: මල්වතු ඔය - අනුරාධපුර, මහවැලි ගඟ - පොළොන්නරුව
- ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය වීම නිසා මුල සිටම ජනාවාස ගංගා නිම්න වල බිහිවීම: උතුරු තැන්න - කලා ඔය, මල්වතු ඔය, නැගෙනහිර තැන්න - වලවේ ගඟ, කිරිඳි ඔය
- වාරි කර්මාන්ත නිර්මාණයට හා වර්ධනයට ගංගා ඉවහල් වීම: කලා ඔය - කලා වැව, මහවැලි ගඟ - මිණිපේ අමුණ
- දේශ සීමා වෙන් කිරීම සඳහා භාවිත වීම: රජරට - කලා ඔය හා මල්වතු ඔය, රුහුණු රට - මහවැලි ගඟ, කළු ගඟ හා බෙන්තර ගඟ, දොළොස්දහස් රට - වලවේ ගඟ හා බෙන්තර ගඟ, අටදහස් රට - වලවේ ගඟ හා මහවැලි ගඟ
- අනුරාධපුර හා රුහුණු රට පාලකයන්ගේ ආරක්ෂක කටයුතු වලට ගංගා ඉවහල් වීම: කාවන්තිස්ස රජු මහවැලි ගඟේ තොටමුණ සියල්ල රැකවල්ලෑම, I පරාක්‍රමබාහු රජ විල්ගම්තොට සිට ත්‍රිකුණාමලය දක්වා සෑම තොටමුණක්ම රැකවල්ලෑම
- ප්‍රවාහනය හා ගමනාගමනය සඳහා ගංගා භාවිතා කිරීම, ගංගා ආශ්‍රිතව මාර්ග බිහිවීම: මාගම සිට රජරට තෙක් වූ මහවැලි ගඟ මාර්ගය
- ගංගා මුවදොර වල හා තොටුපල වල වෙළඳ මධ්‍යස්ථාන පිහිටවනු ලැබීම: මහාතිත්ථ, ගෝකණ්ණ හා ගොඩවාය වරායන්

**iii)** වරායන්

- දිවයින වටා වරායන් පිහිටා තිබීම.
  පැරණි යුගයේදී: දඹකොළ පටුන, මහා තිත්ථ, ගෝකණ්ණ, ගොඩවාය, ඌරාතොට, දේවනගර, ලංකා පටුන
  නූතන යුගයේදී: කොළඹ, ගාල්ල, මඩකලපුව, ත්‍රිකුණාමලය, කල්පිටිය, මීගමුව
- මුල් ජනපදිකයන්ගේ සංක්‍රමණ වරායන් ඔස්සේ සිදුවීම.
  - මහාතිත්ථ - විජය ඇතුළු 700/ පණ්ඩුවාසදේව ඇතුළු පිරිස
  - ගෝකණ්ණ - භද්දකච්චායනා ඇතුළු පිරිස/ ඇගේ සහෝදරයන්
  - දඹකොළ පටුන - සංඝමිත්තා තෙරණිය
- දකුණු ඉන්දියානු ආක්‍රමණ: මහාතිත්ථ වරාය ඔස්සේ චෝල, මාඝ ආදී ආක්‍රමණ
- වෙළඳ මධ්‍යස්ථාන වරායබඳව පිහිටීම (ඌරාතොට, මහාතිත්ථ, ගොඩවාය) හා විදේශ වෙළඳාම (ඉන්දියාව, බුරුමය, චීනය, අරාබිය, ඊජිප්තුව, රෝමය, ග්‍රීසිය ආදී රටවල් සමඟ)
- I මුගලන් හා I විජයබාහු වැනි රජවරුන් යුද්ධ ආධාර ලබා ගැනීම.
- කොළඹ, මීගමුව, කල්පිටිය ආදී වරායන් ඔස්සේ මධ්‍ය කාලීන යුගයේ සිට වෙළඳාම වර්ධනය වීම.
- ත්‍රිකුණාමල වරාය නූතන යුගයේදී ලංකාව කෙරෙහි බටහිර යුරෝපා ජාතීන්ගේ අවධානය යොමු වීමට විශේෂ හේතුවක් වීම.

03)

**i)** රජු මුහුණ දුන් දේශීය හා විදේශීය අභියෝග සහ එතුමා ඒවා ජයගත් අන්දම

- වට්ටගාමිණී අභය රජු දේශීය හා විදේශීය අභියෝග රැසකට මුහුණ දුන් පාලකයෙකි. එම සෑම අභියෝගයක්ම ජයගෙන විදේශිය ආක්‍රමණිකයන්ගෙන් රට බේරාගත් පාලකයෙක් ලෙස ඔහු ලක් ඉතිහාසයේ වැදගත් වේ.

  - මහාරත්තක ඝාතනය කොට රාජ්‍ය ලබා ගැනීම.
  - තීය බ්‍රාහ්මණයාගේ කැරැල්ල.
  - සත් ද්‍රවිඩ ආක්‍රමණය (පුලහත්ථ, බාහිය, පනයමාර, පිළියමාර, දාඨිය)
  - ගිරි නිගන්ඨයාගේ විරෝදය
  - බැමිණිටියා සායට මුහුණපෑම
  - තනිව සේනා සංවිධානය කර ගැනීම
  - සේනාපතිවරුන් රජු හැර යාම

**ii)** අභයගිරි විහාරය පිහිටුවීම

- ක්‍රි.පූ. 89 දී දාඨිය මරා අනුරාධපුර රාජ්‍ය බලය නැවත ලබා ගැනීමෙන් පසුව ගිරි නිගණ්ඨ ආරාමය කඩා බිඳ දමා අභයගිරි විහාරය තැනවීම.
- සැඟව සේනා සංවිධානය කළ අවධියේ රජුට උපහාර කළ කුපික්කුල මහා තිස්ස තෙරුන්ට අභයගිරි විහාරය පූජා කිරීම.
- මහා විහාරයෙන් ඉවත් වූ භික්ෂු පිරිස් අභයගිරියට එක්වීම හා සංඝ භේදයට මඟ පෑදීම.
- රජුගේ විශේෂ අනුග්‍රහය අභයගිරියට හිමිවීම.
- පසුකාලීනව මහායාන අදහස් අභයගිරියට බලපෑමත් විදේශීය බෞද්ධ මධ්‍යස්ථාන සමග සබඳතා පැවැත්වීමත් නිසා අභයගිරිය ජාත්‍යන්තර බෞද්ධ මධ්‍යස්ථානයක් ලෙස වර්ධනය වීම.

**iii)** ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම

- බැමිණිටියාසාය නිසා භික්ෂු පරම්පරා මෙන්ම එතෙක් මුඛපරම්පරාගතව ආරක්ෂා කරගෙන ආ ත්‍රිපිටක ධර්මයද අභාවයට පත් වීමේ තර්ජනයක් මතු වීම.
- වට්ටගාමිණී අභය පාලන සමයේදී ප්‍රාදේශීය පාලකයෙකුගේ අනුග්‍රහය යටතේ මාතුල ජනපදයේ ආලෝක ලෙනේ දී ත්‍රිපිටකය හා අට්ඨකතා පළමුවරට ග්‍රන්ථාරූඪ කරනු ලැබීම.
- අභියෝග හමුවේ වුවද ථෙරවාදී බුදු දහම මෙරට ස්ථාපිත කිරීමට එමගින් හැකි වීම.

04) **i)** වැව්

- වැව් ඉදිකිරීමේ ක්‍රමික වර්ධනයක් දක්නට ලැබීම. ක්‍රි.පූ. තුන්වන සියවසේදී පණ්ඩුකාභය රජු විසින් ජයවැව, අභය වැව,ගාමිණී වැව යන වැව් තුනක් ඉදිකළ බව මහාවංශයේ සඳහන් වීම.
- ක්‍රි.ව. තුන්වන සියවසේදී දේවානම්පියතිස්ස රජු තිසා වැවත්, පසුව නුවර වැවත් ඉදිකර වීම.
- ක්‍රි.ව. පළමුවන සියවසේදී වසභ රජු විසින් මහා පරිමාන වැව් ඉදිකරවීම ආරම්භ කිරීම. ඒ අනුව වැව් 11 කරවීම.(මහවිලච්චිය, මානක්කට්ටිය, නොච්චිපොතාන, හිරිවඩුන්න)
- ක්‍රි.ව. තුන්වන සියවසේ දී මහසෙන් රජතුමා විසින් වැව් දහසයක් කරවීම.(ඒ අතුරින් මින්නේරිය වැව වඩාත් වැදගත්ය. රජතුමා "මින්නේරිය දෙවියෝ" ලෙස සැලකීම. හුරුලු වැව, මහගල්කඩවල වැව, කවුඩුල්ල වැව, කනදරා වැව)
- පළමුවන උපතිස්ස රජු කුඩා ප්‍රමාණයේ වැව් හයක් කරවීම.(මහාදන්තවාපි, පානන්කාමකුලම්, මා එළිය වැව, යෝධ වැව)
- ක්‍රි.ව. හයවන සියවසේදී දෙවන මුගලන් රජු වැව් තුනක් කරවීම.(නාච්චාදූව - පත්තපාසාණවාපි, පදවිය - ධනවාපි, ගරිතවාපි - මෙතෙක් හඳුනාගෙන නොමැත)
- පළමුවන අග්බෝ රජු විසින් ඉදිකරන ලද වැව් දෙකක් වන්නේ කුරුඳු වැව (තන්නිමුරිප්පුකුලම) හා මාමවඩුව වැවය.
- දෙවන අග්බෝ රජු කන්තලේ හා ගිරිතලේ වැව් කරවූහ.
- අටවන, නව වන හා දහවන සියවස් වලදී විශාල ජලාශ ඉදිකළ බවත් නොපෙනේ. ප්‍රතිසංස්කරණ සිදු කර ඇත.(පස්වැනි අග්බෝ, දෙවන උදය, දෙවන මහින්ද, දෙවන සේන)
- පළමුවන විජයබාහු රජතුමා ඌව පලාතේ බුදුගුණ වැව කරවීය.
- පලමුවන පරාක්‍රමබාහු රජතුමා ඉදිකරවන ලද වැව් අතුරින් පරාක්‍රම සමුද්‍රය ඉතා වැදගත්ය. මහාවංශයට අනුව රජු ප්‍රධාන වැව් 163ක් කුඩා වැව් 2376ක් කරවා ඇත.
- දැදුරු ඔයේ කොට්ට බද්ද, සූබර නිජ්ජර හා දෝරදත්තික යන ස්ථාන තුනෙහි ඉදිකරවන ලද ජල යෝජනා ක්‍රමය ඉතා වැදගත් වේ.
- අනුරාධපුර හා පොළොන්නරු යුග වලදී වලවේ කිරිඳි හා මැණික් යන ගංගා මුල්කරගෙන රුහුණේ ද ජලාශ ඉදිකර ඇත.

**ii)** ඇළ මාර්ග

- ක්‍රි.පූ. පළමුවන සියවසේ දී කුටකණ්ණ තිස්ස රජතුමා කරවන ලද වන්නට ඇළ (මීන් විල සෙල්ලිපිය, මහාවංශය)
- වසභ රජු ඇළ මාර්ග දොළහක් සෑදූ අතර ඇළහැර යෝධ ඇළ (ආලිසාර ඇළ) ඉන් ප්‍රධාන වේ. ඇළහැරදී අඹන් ගඟ හරස් කර බැඳ ඇළ මාර්ගය ඔස්සේ සැතපුම් 30ක් බටහිර දෙසට ජලය රැගෙන ගොස් ඇත.
- මහසෙන් රජු පබ්බතන්න ඇළ කරවා මහවැලි ගඟේ ජලය නැගෙනහිරට ගෙන යාම හා අඹන් ගඟ හරස් කොට තලවතු ඇළ සාදවා එමගින් ජලය මින්නේරි ඇළට ගෙන යාම.
- ධාතුසේන රජු සැතපුම් 54ක් දිග ජය ගඟ කරවීම. මෙය කලා වැවෙන් ආරම්භ වී තිසා වැවෙන් අවසන් වේ.
- මල්වතු ඔයේ ජලය සැතපුම් 17ක් දිග ඇළක් මගින් මන්නාරම් දිස්ත්‍රික්කයේ පිහිටි යෝධ වැවට ගෙන යාම.

- මහවැලි ගගේ මණිමේඛලා සිට සැතපුම් 17ක් දිග මිණිපේ ඇළ පළමුවන අග්බෝ රජු විසින් කරවීම.
- කළු ගගේ හත්තොට අමුණෙන් පටන් ගන්නා සැතපුම් 28 දිග ඇළ.
- අඹන් ගගේ අංගමැඩිල්ල ස්ථානයේ සිට එන අංගමැඩිල්ල ඇළ හෙවත් ආකාශ ගංගාව.
- පළමුවන පරාක්‍රමබාහු රජු ඇළ වේලි 165ක් ඇළ මාර්ග 3910ක් කරවූ බව හා කැඩී බිඳී ගිය ඇළවේලි 1753ක් ප්‍රතිසංස්කරණය කරවීම.

**iii)** වාරි තාක්ෂණය

- තාක්ෂණය වඩාත් කැපී පෙනෙන්නේ කුඩා වැව් වලට වඩා විශාල වැව් ඉදිකිරීමේදීය. භූමිය මැනීම, සමකිරීම හා සමෝච්චකරණය සම්බන්ධයෙන් ඉහළ ඉංජිනේරු දැනුමක් පළකොට ඇත.
- දෙපස පිහිටි කඳුගැට ආධාරයෙන් වැව් බැම්ම සෑදීම සිදුකර ඇත. එහෙත් ආකට්ටිමුරුප්පු හා යෝධ වැවේ තාක්ෂණය මීට වෙනස් ය. යෝධ වැවේ බැම්ම සකස් කර ඇත්තේ කොන් දෙකක දිග වේලි දෙකක් බැඳීමෙනි.එහි බැම්ම චාපයක හැඩය ගෙන ඇත.
- වැව් ඉදිකිරීමේ දී සුවිශේෂී තාක්ෂණික අංග කිහිපයක් දක්නට ලැබීම. වැව් බැම්ම, සොරොච්ච, බිසෝකොටුව,සලපනාව.
- වැව් එකිනෙකට සම්බන්ධ කිරීමට ඉදිකොට ඇති සංකීර්ණ ඇළ මාර්ග ජාලය (ඇළහැර ඇළ මින්නේරි වැව දක්වා සකස් කරන විට භූ ලක්ෂණ උපයෝගී කර ගැනීම,ජය ගගේ මුල් සැතපුම් දාහතේ ජල බැස්ම සැතපුමකට අඟල් හයක් පමණක් වීම)
- ජය ගඟ මෙරට ජල මාර්ග තාක්ෂණයේ ශ්‍රේෂ්ඨතම නිර්මාණය වේ. ජය ගඟින් තැනින් තැන විහිදී යන අතුරු ඇළවල් මඟින් කුඩා ගම් වැව් රැසකට ජලය සැපයේ.
- ගංගා හරස් කොට බැම් බැඳීමේ තාක්ෂණයට හොඳම උදාහරණය අංගමැඩිල්ල බැම්මයි. (අඹන් ගගේ පටු ස්ථානයක ගල්පරයක් මත විශාල ගල් කුට්ටි තැන්පත් කොට ඉදිකර ඇත)
- එකල සූක්ෂම මිනුම් උපකරණ භාවිතා කර ඇත. (පැරණි මාදුරු ඔය සොරොච්ච)

05)

**i)** වසභ රජතුමා

- යසලාලක තිස්ස රජු මරා ශුභ හෙවත් සභ රජකමට පත් විය.
- ලම්බකර්ණ වංශයේ ප්‍රථම රජු ලෙස සැලකෙන්නේ වසභ රජුය.
- වසභ රජුගේ ආධිපත්‍ය මුළු දිවයින පුරාම පැතිර පැවති බව වංශකතා හා අභිලේඛන වලින් පැහැදිළි වේ. මහාවංශය, පූජාවලිය, සමන්තපාසාදිකාව, අනුරාධපුරයේ තම්මැන්නා සෙල්ලිපිය, උතුරෙන් හමු වූ වල්ලිපුරම් රන් සන්නස, වැල්ලවායේ හබැස්ස සෙල්ලිපිය, දකුණේ සිතුල්පව්ව, තිස්සමහාරාම හා ගොඩවාය ලිපි, නැගෙනහිර මඩකලපුව කාසිපොටෙයි සෙල්ලිපිය.
- පොත්තාදේවිය අගමෙහෙසිය බවට පත්කර ගනිමින් වසර 44ක් සාමකාමීව පාලනය ගෙන යාම.
- දේශපාලන වශයෙන් අභ්‍යන්තර කැරලි කෝලාහල හා විදේශීය ආක්‍රමණ එල්ල නොවූ අවධියකි.
- ආර්ථික වශයෙන් කෘෂිකර්මාන්තය දියුණු කිරීම.
- මහ වැව් තැනවීමේ පුරෝගාමියා වීම.(මහ වැව් 11ක්, ඇළවල් 12ක් ඉදිකළ බව මහාවංශයේ සඳහන් වේ.) මහා විලච්චිය වැව, මානා කැටිය වැව, නොච්චිපොතාන වැව, හිරිවඩුන්න වැව හා ඇළහැර හෙවත් අලිසාර ඇළ, මිණිපේ ඇළ ඉදිකිරීම.
- අනුරාධපුර නගරය අලංකාර කිරීම(උයන් වතු, ජල යන්ත්‍ර සහිත විසිතුරු පොකුණ)
- රෝහණයේ චිත්තල පබ්බතයෙහි ස්ථූප දහසක් ඉදිකළ බව මූලාශ්‍ර වල සඳහන් වීම.

- මාගම අනුරාරාමය, මුවලාරාමය ගොඩනැගීම හා විහාරාරාම ප්‍රතිසංස්කරණය කරවීම.
- අගමෙහෙසිය වූ පොත්තාදේවිය විසින් ද වටදාගයක් ඉදිකර වීම.
- ප්‍රාදේශීය පාලනය ක්‍රමවත් කිරීම.(උතර-රෝහණ දේශය, දූටග-දක්ෂිණ දේශය, උතුරේ නක දිව/ඉසිගිරි ඇමතිවරයා ලබා පාලනය කිරීම ආදිය සෙල්ලිපිවලින් සනාථ වේ.)

**ii)** රජරට චෝල ආදිපත්‍ය

- ක්‍රි.ව. දහවන සියවසේ එල්ල වූ දකුණු ඉන්දියානු චෝල ආක්‍රමණ නිසා අනුරාධපුර රාජධානිය බිඳ වැටුණි.
- උතුරු ඉන්දියාවේ චෝල ආධිපත්‍ය පැතිර වූ ප්‍රබල චෝල පාලකයන් දෙදෙනා වූයේපළමුවන රාජරාජ හා පළමුවන රාජේන්ද්‍රයි. චෝල ආදිපත්‍ය පැවති සමයේ සිටි අනෙක් පාලකයන් වූයේ පළමුවන රාජාධිරාජ, දෙවන රාජේන්ද්‍ර, වීර රාජේන්ද්‍ර, අධිරාජේන්ද්‍ර සහ පළමුවන කුලෝත්තුංගයි.
- දුර්වල පාලකයෙක් වූ පස්වන මිහිඳු රජ දවස රාජරාජගේ ආක්‍රමණික චෝල හමුදා ලංකාවට ගොඩබැස අනුරාධපුරය කොල්ලකා විනාශ කිරීම, පස්වන මිහිඳු රජු රෝහණයට පලා යාම.
- ඉන්පසු එළඹි අවුරුදු විස්සකට අධික කාලය රජරට බලය පවත්වා ගැනීමට රාජරාජ සමත් වී යැයි මතයක් පැවතීම.
- චෝල අධිරාජ්‍යයා වූ රාජේන්ද්‍ර විසින් ක්‍රි.ව. 1017 දී පස්වන මිහිඳු රජු සිරකරුවෙකු ලෙස අල්ලාගෙන චෝල දේශයට රැගෙන යාමෙන් පසු රජරට ප්‍රදේශය චෝල අධිරාජ්‍යයේ කොටසක් බවට පත් විය. චෝලයන් විසින් එය "මුම්මඩි සෝලමණ්ඩලම්" ලෙස නම් කිරීම. එසේම පෙළොන්නරුව පාලන මධ්‍යස්ථානය බවට පත්කර ගත් අතර එය "ජනනාථමංගලම්" ලෙස හැඳින් වීම.

- මුම්මඩි සෝල මණ්ඩලම් කොටස් දෙකකට බෙදා තිබීම. රාජරාජ චෝල වළනාඩු හා වික්කිරම ශෝල වළනාඩු.

- පළමුවන රාජරාජ හා පළමුවන රාජේන්ද්‍ර යන රජුන්ගේ සෙල්ලිපි ලංකාවෙන් හමුව තිබීම.(පළමුවන රාජේන්ද්‍රගේ තිරුමණ්ණි වළර ප්‍රශස්තිය සහ දැනට පොළොන්නරුවේ හා කොළඹ කෞතුකාගාරයේ තැන්පත්කොට ඇති සෙල්ලිපි)

- මෙරට සිටි චෝල ප්‍රදේශික පාලකයන් පිළිබඳව තොරතුරු හමමු නොවන අතර චෝලයින් විසින් ලංකාව පාලනය කළ ආකාරය ගැන යම් යම් අනුමාන පමණක් තිබීම.(යුද්ධ හමුදාවේ උසස් තනතුරු, පාලන තන්ත්‍රයේ උසස් තනතුරු දකුණු ඉන්දියානුවන් දැරූ බව. ප්‍රාදේශීය පාලනයේ ගම ප්‍රධාන වීම. බදු අයකර තිබීම රාජරාජගේ තන්ජෝර්හි ඇති ලිපියක ලංකාවේ ගම් පහකින් ගත් බදු තන්ජෝර දේවාලයට ප්‍රධානය කිරීම පිළිබඳව සඳහන් වීම හා එකී බදු මුදල් වී, මී ගසේ කිරි වලින් ගෙවා තිබීම. එසේම වාර්ෂිකව කප්පම් ගෙවීමක්ද සිදු වන්නට ඇත)

- ඔවුන්ගේ පාලන සමයේදී බෞද්ධාගමික ගොඩනැගිලි විනාශ කිරීම සිදු කර ඇත. කෙසේ වෙතත් ඇතැම් අවස්ථා වලදී ප්‍රදානයන්ද කර තිබීම. (වෙල්ගම්වෙහෙරට, රාජරාජපෙරුම්පල්ලි)

- හින්දු කෝවිල් ගණනාවක් ඉදිකිරීම.(වාණවණ්මාදේවි ඊෂ්වරම්) තඹ හා ලෝකඩ වලින් කළ හින්දු දේව ප්‍රතිමා රැසක් හමුවී ඇත.(ශිව, විෂ්ණු, පාර්වතී, නටරාජා) චෝල අධිරාජ්‍යයේ ප්‍රාදේශිය නිලධාරියෙකු විසින් මන්නාරමේ ගොඩනගන ලද කෝවිලක් අධිරාජ්‍යයාගේ නම මුල් කරගෙන "රාජරාජේශ්වර" යනුවෙන් නම් කර ඇත. මෙකල පදවියේ ද හින්දු කෝවිලක් ඉදිකර තිබේ.

- චෝල බල ප්‍රදේශය පුරාම දකුණු ඉන්දියානු වෙළඳ ශ්‍රේණි පැතිර සිටි බව පෙනේ.

- 1070 දී පළමුවන විජයබාහු රජතුමා චෝල ආධිපත්‍යයෙන් රජරට මුදවා ගැනීමට සමත් වීම.

**iii)** ආර්ය චක්‍රවර්ති පෙළපත

- ආර්ය චක්‍රවර්තීන් පිළිබඳ තොරතුරු යාල්පානවෛපවමාලෙ සහ ශේශණසාශසේගරමාලෙයි යන මූලාශ්‍ර වල අන්තර්ගත වීම.
- 1344 දී දිවයිනට පැමිණි ඉබන් බතුතා ආර්යචක්‍රවර්තීන් "ලංකාවේ සුල්තාන්" ලෙස හඳුන්වා තිබීම.
- යාපන රාජධානියේ ඉතිහාසයේ ආර්යචක්‍රවර්තී පාලකයන් දොළොස් දෙනෙකු පිළිබඳ තොරතුරු හමුවේ.

  1. ශිංගෙ ආරියන් නමින් ප්‍රකට වූ විජය කුලංගෙ පළමු ආර්යචක්‍රවර්තී පාලකයා වීම. 14 වන සියවසේ දී යාපනය කේන්ද්‍ර කොටගෙන රාජධානියක් පිහිට වූ මොහු නල්ලූර් කන්දස්වාමි කෝවිල ඇතුළු කෝවිල් කිහිපයක් කරවීම.
  2. කුලශේකර ශිංගෛ ආරියන් - කෘෂිකර්මාන්තයේ අභිවෘද්ධියට වැඩි අවධානයක් යොමු කිරීම.
  3. වික්කිරම ශිංගෛ ආරියන් - දෙමළ සිංහල වැසියන් අතර සාමයක් ඇති කිරීමට සමත් වීම.
  4. වරෝදය ශිංගෛ ආරියන් - අතර සාමයක් ඇති කිරීමට සමත් වීම.
  5. මාර්තාණ්ඩ ශිංගෛ ආරියන් - අධ්‍යාපනය හා කෘෂිකර්මාන්තය දියුණු කළ අතර වන්නියාර්වරුන්ගේ බලය සීමා කිරීමටද සමත් විය.
  6. කුණපූෂණ ශිංගෛ ආරියන්ගේ සමයේ යාපන රාජධානිය සමෘද්ධිමත්ව පැවතීම.
  7. විරෝදය ශිංගෛ ආරියන් - වන්නියාර්වරුන්ගේ මෙහෙයවීමෙන් සිංහල වැසියන් ඇතිකළ කැරැල්ල මර්දනය කිරීම.
  8. ජයවීර ශිංගෛ ආරියන් - මුතුපර සම්බන්ධයෙන් බුවනෙකබාහු රජු සමඟ ඇතිකරගත් සටනින් ජයගෙන වසර 12ක් තිස්සේ ස්වකීය ආධිපත්‍ය දිවයිනේ පැතිරවීමට සමත් වීම.
  9. කුණවීර ශිංගෛ ආරියන් - දිවයිනේ දකුණේ ප්‍රදේශ කිහිපයකට පහර දී එම ප්‍රදේශ වල දෙමළ ජනයා පදිංචි කරවීමට සමත් විම.
  10. කනගශූරිය ශිංගෛ ආරියන් - වන්නියාර්වරුන්ගේ මෙහෙය වීමෙන් ඇතිවු සිංහලයන්ගේ කැරැල්ලට මුහුණ දීමට අපොහොසත්ව ඉන්දියාවට පලාගිය නමුත් වසර 17කට පසුව පෙරළා පැමින රාජ්‍යය භාර ගැනීම.
  11. පරරාජශේකරන්ගේ සමයේ සාහිත්‍ය ප්‍රබෝධයක් පැවතීම. ඔහුගේ සහෝදරයෙකු යාපනයේ දෙමළ ශාස්ත්‍රාලයක් පිහිටුවා දකුණු ඉන්දියාවෙන් දෙමළ පොත් විශාල සංඛ්‍යාවක් ගෙන්වීම හා ග්‍රන්ථකරණයේ නිරතවීම. ඔහුගේ බෑනා වූ අරිශකේශරී සංස්කෘත රඝුවංශය දෙමළට පරිවර්තනය කිරීම.
  12. සංකිලි 1519 දී පරරාජශේකරම් මරා රජවීම. මේ අවධියේදී පෘතුගීසීන් යාපනය ආක්‍රමණය කිරීම. අභ්‍යන්තර අර්බුධ හේතුකොටගෙන 156 දී මොහුට රාජ්‍යය අහිමිවීම.

- තෙවන වික්‍රමබාහු රජ දවස ගම්පොළ රාජධානියට පහර දි එහි ඇතැම් ප්‍රදේශ වලින් බදු අයකර ගැනීමට තරම් මෙම පාලකයන් ඇතැම් අවස්ථා වල ශක්තිමත් වීම.
- සයවන පරාක්‍රමබාහු රජු සපුමල් කුමරු යවා ආර්යචක්‍රවර්තීන් පරාජය කිරීමට සමත් වීම.

**iv)** ගම්පොළ අවධියේ යාපන රාජ්‍යයේ බල ව්‍යාප්තිය

- මේ පිළිබඳ තොරතුරු ලැබෙන මූලාශ්‍ර කිහිපයක් ලෙස දෙමළ ලිපිය, මැදවල විහාර ලිපිය, නිකාය සංග්‍රහය, රාජාවලිය, අලකේෂ්වර යුද්ධය සඳහන් කළ හැකිය.
- ලංකා ඉතිහාසයේ ගම්පොළ රාජධානි යුගය ලෙස සැළකෙන්නේ දළ වශයෙන් ක්‍රි.ව.1341 - 1410 අතර කාලයයි.
- යාපනය කේන්ද්‍ර කරගෙන උතුරේ රාජ්‍යයන් ගොඩනැගීම ආරම්භ වූයේ ක්‍රි.ව. 1310 - 1311 කාලයේදීය.
- යාපනය රාජ්‍යයේ පාලකයන් ණිආර්යචක්‍රවර්තීඃ යන පොදු නාමයෙන් හඳුන්වා ඇත.
- ගම්පොළ රාජධානි සමය වන විට ආර්යචක්‍රවර්තීන්ගේ බලය වර්ධනය වෙමින් පැවතිනි.
- ක්‍රි.ව. 1344 මෙරටට පැමිණි ඉබන් බතුතා ආර්යචක්‍රවර්තී "ලංකාවේ සුල්තාන්" ලෙස හඳුන්වා තිබේ. එවකට මුතු වෙළඳාමද ආර්යචක්‍රවර්තී අත පැවති බව දක්වයි.

- ගම්පොළ තුන්වන පාලකයා වූ තුන්වන වික්‍රමබාහු රජ දවස ආර්යචක්‍රවර්තීන්ගේ හමුදාව සිංහල රාජධානියට කඩා වැදුණු බව කොටගම ද්‍රවිඩ ලිපියේ සඳහන් වේ.
- මැදවල විහාර ලිපියට අනුව තවත් අවස්ථාවකදී ආර්යචක්‍රවර්තී විසින් රට අභ්‍යන්තරයේ බලයක් ගොඩනගා ගෙන තිබූ බව පැහැදිළි වේ. එසේම රට අභ්‍යන්තරයේ ප්‍රදේශ කිහිපයක් වන සිදුරුවාන, බලවිට, මාතල, දුම්බර හා සගම තුන් රට "මඩිගය" බමුණන්ට පවරා දීමෙන් මෙකී කාරණය තව දුරටත් පැහැදිළි වේ.
- එමෙන්ම මේ වන විට ආර්යචක්‍රවර්තී කොළඹ, වත්තල, හලාවත, මීගමුව යන වෙළඳ මධ්‍යස්ථානයන් හි බලය අත්පත් කරගෙන තිබිණි. ඉන්දියන් සාගරයේ වෙළඳාම මොහු අත පැවතිණි.
- ආර්යචක්‍රවර්තී පලවා හැරීම සඳහා එකළ අගමැතිව සිටි අලගක්කෝණාර කෝට්ටේ බලකොටුවක් ඉදිකිරීම ඇතුළු තවත් පියවර කිහිපයක් ගෙන ඇත. මෙකී අලගක්කෝණාර යුද සංවිධානය ශක්තිමත් කිරීමෙන් පසුව ආර්යචක්‍රවර්තීන්ගේ බදු එකතු කරන්නන් හට පහර දී පලවා හැරියේය.
- මේ බව ඇසූ ආර්යචක්‍රවර්තී කෝපයට පත්ව ගොඩින් හා මුහුදින් එකවර පහරදීම සඳහා සේනාංක දෙකක් එවීය. ගොඩින් පැමිණි සේනාව මාතලේ කඳවුරු බැඳගත් අතර මුහුදින් පැමිණි සේනාව දෙමටගොඩ හා ගොරකාන කඳවුරු බැඳගැනීම.
- මේ තත්වය නිසා ගම්පොළ පාලකයා වූ පස්වන බුවනෙකබාහු රජු රයිගමට පලා ගියේය.
- උඩරට සේනාව විසින් මාතලේ කඳවුරු බැඳගෙන සිටි සේනාව පරාජය කළේය. අලගක්කෝණාර විසින් දෙමටගොඩ හා ගොරකාන කඳවුරු බැඳගෙන සිටි සේනාව විනාශ කිරීමට සමත් විය.
- මෙයින් යාපන රාජ්‍යයේ බල ව්‍යාප්තිය සීමා විය.

## C කොටස

06)

අරමුණ

- පෘතුගීසීන් - පෙරදිගට පැමිණීමට අරමුණු දෙකක් මුල් විය.
  01.වාණිජ - වෙළඳ ද්‍රව්‍ය යුරෝපයට ගෙන ගොස් විකුණා ලාබ ඉපයීම
  02.ආගමික - කතෝලික ආගම ප්‍රචාරය කිරීම
- ලන්දේසි - ඔවුන්ද පැමිණියේ වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනීම සහ ස්වකීය ආගම වූ පොතෙස්තන්ත්‍ර ආගම ප්‍රචාරය කිරීමටයි. එසේ වුවත් ලන්දේසීන්ගේ ආර්ථික අරමුණ පෘතුගීසීන්ට සාපේක්ෂව වඩාත් ප්‍රබල වී යයි කිව හැක.

ආර්ථික ප්‍රතිපත්තිය

- පෘතුගීසි - දේශපාලන අධිකාරිය විසින්ම මෙම ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීම
- ලන්දේසි - වෙළඳ සමාගම විසින් ආර්ථික ප්‍රතිපත්ති මෙහෙයවීම
- දෙපාර්ශවයම - මෙරට ක්‍රියාත්මක කළ ආර්ථික ප්‍රතිපත්තියේ ප්‍රධාන අරමුණු දෙකක් විය. යුරෝපය තුළ ඒ වන විට වෙළඳ වටිනාකමක් පැවති ද්‍රව්‍ය මෙරටින් ලබා ගැනීම.
  ශ්‍රී ලංකාවේ වරායන් ආශ්‍රිතව මෙතෙක් කල් වෙළඳ කටයුතු වල නියැලුණ ආසියානු වෙළඳුන්ගේ වෙළඳ ඒකාධිකාරය තමන් අතට පත්කර ගැනීම.
- පෘතුගීසීන් මූලික වශයෙන් ස්වකීය ආර්ථික කටයුතු සඳහා දේශීය ආර්ථික හා පරිපාලන ක්‍රමය ඒ ආකාරයෙන්ම ක්‍රියාවට නැංවිය.
- ලන්දේසීන්ද මේ හා සමාන ආකාරයෙන් ක්‍රියා කර ඇත.
  - ❖ පාරම්පරිකව පැවති ඉඩම් භුක්ති ක්‍රමය ප්‍රයෝජනයට ගැනීම.
  - ❖ කුල ක්‍රමය සහ අනිවාර්ය සේවා රාජකාරී ක්‍රමය උපයෝගී කර ගැනීම

- එසේ නමුත් ලන්දේසීහු ඔවුන්ටම ආවේණික ලක්ෂණ සහිත ප්‍රතිපත්තියක්ද ක්‍රියාත්මක කළහ.
    - ❖ ලංකාවේ ඉඩම් පිළිබඳ තොරතුරු අඩංගු තෝම්බු සකස් කිරීම මගින් ලන්දේසීන් ආර්ථික වටිනාකමක් සහිත ඉඩම් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම.
- ප්‍රධාන වෙළඳ ද්‍රව්‍ය ලෙස කුරුඳු සැළකුව නමුත් ලන්දේසීන් සිය අයවැය පරතරය පියවා ගැනීම සඳහා භාවිත කළේ පුවත් වෙළඳාමෙන් ලද ආදායමයි.
    - ❖ කුරුඳු, කෝපි වගාකරවීම
    - ❖ අන්තර් ආසියාතික වෙළඳාමට සම්බන්ධ වීම
    - ❖ ඇළ මාර්ග ඉදිකර වීම
    - ❖ ඇතැම් වාරි මාර්ග ප්‍රතිසංස්කරණය කරවීම හා ආණ්ඩුවේ වියදම් අඩුකර ගැනීමේ අරමුණින් සහල් නිශ්පාදනය පවත්වාගෙන යාම
    - ❖ කිරම, ඌරුබොක්ක වැනි ප්‍රදේශ පදනම් කරගෙන වැව් ප්‍රතිසංස්කරණය කිරීමට පියවර ගැනීම හා මුතුරාජවෙල අස්වැද්දීම
    - ❖ කපු වැවීම සහ රෙදි සායම්කරණය සඳහා භාවිතා කළ ඉන්ඩිගෝ වැවීම
    - ❖ ඇතැම් ප්‍රදේශ වල කුරුඳු වගා කිරීමට පියවර ගැනීම - උදා:-කදිරාන, ඇවරිවත්ත, කුරුඳුවත්ත
    - ❖ උඩරට රාජධානිය සමඟ අභ්‍යන්තර වෙළඳාමක් පවත්වාගෙන යාම හා රට තුළ වෙළඳාමේ ඒකාධිකාරයක් ගොඩනැගීම

07)

i) බ්‍රිතාන්‍ය විසින් උඩරට රාජධානිය අල්ලාගනු ලැබීමට ආසන්න සමයේ එම රාජධානිය සමඟ සම්බන්ධකම් පවත්වාගෙන ගිය ඉංග්‍රීසි ජාතික නිලධාරියා නම් කරන්න.

- ජෝන් ඩොයිලි

ii) උඩරට ගිවිසුම අත්සන් කළ බ්‍රිතාන්‍ය ආණ්ඩුකාරයා සහ උඩරට ප්‍රභුවරයෙකු නම් කරන්න.

- ආණ්ඩුකාරයා - රොබට් බ්‍රවුන්රිග්
- ප්‍රභුවරු - ආහැලේපොළ, මොල්ලිගොඩ, පිළිමතලව්වේ, මොනරවිල කැප්පෙටිපොළ, රත්වත්තේ, දුල්ලෑව, මිල්ලෑව

iii) උඩරට ගිවිසුමේ අන්තර්ගත කරුණ සැකෙවින් දක්වන්න.

- 1815 මාර්තු 2 සෙංකඩගල මගුල් මඩුවට රැස්වූ අධිකාරම් දිසාවේ නිළමෙවරු හා ඉංග්‍රීසි රජුගේ නියෝජිතයා ලෙස ආණ්ඩුකාරයා ඉදිරියේ කියවා අත්සන් තබන ලද ලේඛනය උඩරට ගිවිසුමයි. මෙය වගන්ති 12කින් සමන්විතය.
- 1, 2, 3 වගන්ති - “මලබාර්” පාලකයා ලෙස හඳුන්වා ඇති ශ්‍රී වික්‍රම රාජසිංහ රජුගේ පාලනය දුර්දාන්ත එකක් බවත්, ඔහු ජනතා අයිතිවාසිකම් උල්ලංඝනය කළ බවත්, ඒ නිසා එම පාලකයා බලයෙන් පහකොට ඔහු ඇතුළු ඔවුන්ගේ නායක්කර් ඥාතීන් පිටුවහල් කරන ලද බවත් සඳහන් කරයි.
- 4 වගන්තිය - උඩරට රාජ්‍ය තුන්වන ජෝර්ජ්රජුට පවරන ලද බවත් ඒ පළාත් වල පාලනය එංගලන්තයේ රජු වෙනුවෙන් ඉංග්‍රීසි ආණ්ඩුකාර වරයා සිය ඒජන්තවරුන් මගින් ගෙනයන බවත් දේශීය ප්‍රධානීන්ගේ හා මුලාදෑනීන්ගේ නිලතල හා සම්බන්ධ අයිතිවාසිකම් වරප්‍රසාද සහ බලතල ආරක්ෂා කරන බවත් සඳහන් කරයි.
- 5 වගන්තිය - බෞද්ධාගම හා දේවාලගම අනුල්ලංඝනය බවත් ඒවාට අදාල පුදපූජා, පිළිවෙත්, පූජ්‍ය ස්ථාන හා පැවිද්දන් බ්‍රිතාන්‍ය රජය විසින් ආරක්ෂා කරන බවත් සඳහන් වෙයි.
- 6,7,8 වගන්ති - උඩරට වැසියන්ගේ සිවිල් හා අපරාධ නඩු පවතින ක්‍රමයටම විසඳන බව සඳහන් කරන අතර ශාරීරික වධ හිංසා පැමිණවීම, අංග විච්ඡේදනය ආදී දඬුවම් තහනම් කරන බවත් ආණ්ඩුකාරවරයාගේ නියමයකින් තොරව මරණ දණ්ඩනය නියම නොකරන බවත් දක්වයි.

- 9 වගන්තිය - උඩරට වැසියන් නොවන පුද්ගලයන් සම්බන්ධ සිවිල් හා අපරාධ නඩු ඉංග්‍රීසි නීතිය ප්‍රකාර විසඳන බවත් දක්වයි.
- 10 වගන්තිය - සීමිත ව්‍යතිරේක අවස්ථා වලදී හැරුණුකොට හමුදා මෙහෙයුම් කාලයේ ප්‍රසිද්ධ කරන ලද අඥා මේ ගිවිසුම මගින් අවලංගු වන බව සඳහන් කරයි.
- 11 වගන්තිය - උඩරට ආදායම් ඉංග්‍රීසි රජු වෙනුවට ඒජන්තවරුන් එකතුකරන බව දක්වයි.
- 12 වගන්තිය - උඩරට හා පහත රට අතර වෙළඳාමට පැවති බාධා අහෝසි කරන බවත් අවශ්‍ය අවස්ථා වලදී පාලනයේ වෙනස්කම් ඇති කිරීමේ අයිතිය ඉංග්‍රිසි ආණ්ඩුව සතුව තබා ගන්නා බවත් සඳහන් කරයි.

iv) ඉහත සඳහන් ප්‍රකාශය විචාරාත්මකව විමසන්න.

- නායක්කර් පාලනය අවසන් කොට ස්වදේශිය පාලනයක් ප්‍රතිස්ථාපනය කිරීමට ඉංග්‍රීසීන් කටයුතු කරනු ඇතැයි උඩරටියන් බලාපොරොත්තු වූවත් එය ඉටු නොවීම.
- උඩරට රාජ්‍යත්වය අහෝසි කිරීම
- බෞද්ධාගම ආරක්ෂා කරන බව ගිවිසුමේ සඳහන් කළද උඩරට රජු යටතේ පැවති සම්භාවනීයත්වය හා ආරක්ෂාව අන්‍යාගමික පාලකයන්ගෙන් නොලැබෙන බව භික්ෂූන්ට අවබෝධ වීම.
- ප්‍රධානීන්ගේ නිලතල හා වරප්‍රසාද ආරක්ෂා කරන බවට පොරොන්දු වූවත් ඔවුන්ට ඉහළින් ඉංග්‍රීසි නිලධාරින් පත් කිරීම නිසා ඔවුන්ගේ ගරුත්වයට තර්ජනයක් එල්ලවීම හා සාමාන්‍ය ජනයා ඉදිරියේ ඔවුන්ගේ අභිමානයට හානියක් වීම.
- පරිපාලනයේදී දේශීය චාරිත්‍ර හා ආයතන ආරක්ෂා කරන බවට ගිවිසුමෙන් පොරොන්දු වූ නමුත් විදේශීය නිලධාරින් හා විදේශීය භාෂාව භාවිත වීම නිසා පරිපාලන හා අධිකරණ කටයුතු ජනතාවට ආගන්තුක වීම.
- විදේශිය පාලකයන් ඉවත්ව නොයන බව පෙනී යාමත් සමඟ පොදුවේ හටගත් කලකිරීම නිසා භික්ෂූන් වහන්සේ රදළ ප්‍රධානීන් හා ජනතාව යන පාර්ශව තුන තුලම බ්‍රිතාන්‍ය පාලනය කෙරෙහි අප්‍රසාදයක් හට ගැනීම.
- මේ අනුව සටන ඇතිවීමට තුඩු දුන් ප්‍රධානතම සාධනය ඉංග්‍රීසීන් ගිවිසුමෙන් වූ පොරොන්දු ඉටු නොකිරීම බව කව හැකිය.

08)

- 1972 ජනරජ ව්‍යවස්ථාව සකස් කරන ලද්දේ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් ව්‍යවස්ථා සම්පාදක මණ්ඩලයක් ලෙස ක්‍රියා කරමිනි. එහෙයිනි මෙය දේශීය නිර්මාණයකි.
- මෙම ව්‍යවස්ථාව 1972 සිට 1978 දක්වා ක්‍රියාත්මක විය.
- මෙම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වීමත් සමඟ එතෙක් පැවති සෝල්බරි ව්‍යවස්ථාව අහෝසි විය.
- මෙම ව්‍යවස්ථාව ජනරජ ව්‍යවස්ථාවකි.
- මෙතෙක් බ්‍රිතාන්‍ය කිරීටය සමඟ පැවති සම්බන්ධතා මේ සමඟ අවසන් විය.
    - ❖ බ්‍රිතාන්‍ය රැජින තවදුරටත් මෙරට නායිකාව නොවීය. එහෙයින් ආණ්ඩුකාර තනතුර අහෝසි විය.
    - ❖ ප්‍රිවි කවුන්සිලයට අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතිය අහෝසි කෙරිණි.
    - ❖ ශ්‍රී ලංකාව ස්වෛරී ජනරජයක් විය. ඒ සමඟ රටේ නාමයද ශ්‍රී ලංකාව නම් විය.
- පාලනය හා සම්බන්ධ ව්‍යවස්ථාදායක බලය පැවරුණේ මහජන ඡන්දයෙන් තෝරාගත් මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත වූ ජාතික රාජ්‍ය සභාවටය.
- ඒක මණ්ඩල ව්‍යවස්ථාදායකයක් වූයෙන් එතෙක් පැවති සෙනෙට් සභාව අහෝසි විය. ජනතාවගේ පරමාධිපත්‍ය උත්තරීතර බව ප්‍රකාශ විය.
- ජාතික රාජ්‍ය සභාවට සීමාවකින් තොරව ව්‍යවස්ථා පැනවීමට බලයක් පැවරුණි. සෝල්බරි ආණ්ඩුක්‍රමය යටතේ පැවති සීමා (29 (2)) ඉවත් කෙරිණි. මෙතෙක් පැවති රාජ්‍ය සේවා කොමිසම හා අධිකරණ සේවා කොමිසම අහෝසි කෙරිණි.

- විධායක කටයුතු මෙහෙයවන ලද්දේ අගමැති ප්‍රමුඛ කැබිනට් මණ්ඩලය විසිනි. අහෝසි කළ ඉහත කී කොමිෂන් සභා බලතල ක්‍රියාත්මක කරන ලද්දේ විධායක විසිනි.
- ජනාධිපති ධූරය නාමික විධායකයක් බවට පත්විය.
- මූලික අයිතිවාසිකම් පිළිබඳ වගන්ති ව්‍යවස්ථාවට ඇතුළත් කොට තිබිණ. ජාතික භාෂාව, ජාතික ආගම, ජාතික ගීය, ජාතික කොඩිය ව්‍යවස්ථාවට ඇතුළත් කොට තිබිණි. බුද්ධාගම ආරක්ෂා කරන බවට හා පෝෂණය කරන බවට වගන්ති ඇතුළත් විය.
- මෙම ව්‍යවස්ථාව යටතේ පවත්වන ලද එකම මැතිවරණය 1978 දී පැවැත්විණ. මන්ත්‍රීවරු 108 දෙනෙකු තෝරාගනු ලැබිණ.

09)

**i)** නිශ්ශංකමල්ල රජතුමා

- මහා පරාක්‍රමබාහු රජුගෙන් පසුව පොළොන්නරුවේ බලයට පත් වැදගත් පාලකයෙකු වශයෙන් නිශ්ශංකමල්ල රජු සලකනු ලැබේ.
- කාලිංග පෙලපතට අයත් නිශ්ශංකමල්ල රජු පිළිබඳ තොරතුරු ගල්පොත සෙල්ලිපිය, දොරටියාව සන්නස, වඳුරුප්පේ ලිපිය, දඹුලු ගිරි ලිපිය, රාජාවලිය හා මහාවංශය ආදී මූලාශ්‍රවලට අන්තර්ගත වීම.
- සෙල්ලිපි වැඩිම සංඛ්‍යාවක් පිහිට වූ පාලකයෙකු ලෙස මේ රජු ප්‍රකට වීම.
- අභියෝග රැසකට මුහුණ දීම
  - ❖ ඉන්දියාවේ කාලිංග දේශයේ උපත ලද්දෙකු වූ බැවින් නිශ්ශංකමල්ලගේ විදේශික සම්භවය.
  - ❖ පළමුවන පරාක්‍රමබාහු රජුගේ දැවැන්ත පෞරුෂය, ඔහුගේ විශිෂ්ඨ සේවාව හා කීර්තිය.
  - ❖ ගොවිකුල ජනයාගේ විරෝදය.
  - ❖ සේනාධිපතිවරුන්ගේ විරෝධය.
  - ❖ කාලිංග විරෝධී පාණ්ඩ්‍ය වංශික බලවේග.
  - ❖ ප්‍රතිපත්ති ප්‍රදේශ වල වැසියන්ගේ විරෝධතා.
- ඒවා ජයගත් අන්දම.
  - ❖ කාලිංග වංශිකයන්ට මෙරට රාජ්‍ය උරුමයක් ඇති බව තහවුරු කිරීමට උත්සාහ ගැනීම හා කාලිංගයේ ඇති වැදගත්කම නිරතුරුව සිහිපත් කරවීම.
  - ❖ පළමුවන පරාක්‍රමබාහු රජු තම වංශයෙහි පැවැත්ම උදෙසා සිංහපුරයට හසුන්පත් යවා තමා ගෙන්වාගත් බව ප්‍රකාශ කිරීම.
  - ❖ පරාක්‍රමබාහු රජුට කීර්තිය ලබාදුන් දෑ තමන් ද කළ බව ප්‍රකාශ කිරීම හා පරාක්‍රමබාහු රජු අනුකරණය කිරීම.
  - ❖ පරාක්‍රමබාහුගේ කාර්ය සිද්ධීන් අවතක්සේරු කොට ඒ වෙනුවට තමන්ගේ ශ්‍රේෂ්ඨත්වය කියාපෑම.
  - ❖ ගොවිකුල ජනයාට නිග්‍රහ කිරීම හා තර්ජනය කිරීම.
  - ❖ සංචාර මඟින් ප්‍රත්‍යන්ත ප්‍රදේශ වල විරෝධතා මැඩපැවැත්වීම සහ රටවැසියන්ගේ පක්ෂපාතීත්වය දිනා ගැනීමට උත්සහ දැරීම. උදා:- සහනශීලි බදු ප්‍රතිපත්තියක් අනුගමනය කිරීම.(තැති අඩ, පිසඹුරුවත ආදී බදු අහෝසි කිරීම)
  - ❖ බෞද්ධාගමට අනුග්‍රහ දැක්වීම.
  - ❖ පරාක්‍රමබාහු රජු විසින් ගොඩ නගන ලද පරිපාලන තන්ත්‍රය නිසි ලෙස හසුරුවාගෙන වසර නවයක් රට තුල දේශපාලන එක්සත් භාවය හා ස්ථාවරත්වය පවත්වාගෙ යාමට සමත් වීම.

- සංස්කෘතික සේවය.
    - ❖ භින්නව පැවති තුන් නිකායන් සමගි කිරීම හා සසුන ආරක්ෂා කිරීම පිණිස භික්ෂූන්ට අවවාද කිරීම.
    - ❖ විවිධ ප්‍රදේශ වල සිද්ධස්ථාන පිළිසකර කරවීම.(අනුරාධපුර, මහාගාම, මැඩිලිගිරිය, වැලිගම්වෙහෙර, දඹුල්ල)
    - ❖ සිද්ධස්ථාන රැසක් කරවීම.(රන්කොත් වෙහෙර, වටදාගය, හැටදාගය, නිශ්ශංකලතා මණ්ඩපය, සංඝරාම විහාරය)
    - ❖ විවිධ ස්ථාන වල දාන ශාස්ත්‍ර හා බ්‍රහ්ම ශාස්ත්‍ර පිහිටුවීම.
    - ❖ තුලාභාර දීම.

**ii)** දහනව වන සියවසේ කෝපි වතු වගාව

- රජයේ වෙළඳ ඒකාධිකාරය යටතේ පැවති ඉංග්‍රීසීන්ගේ ප්‍රධාන ආදායම් මාර්ග වූ කුරුඳු වෙළඳාම දහනව වන සියවස මුල් අවධියේ අඩපණ වීම නිසා කුරුඳු වෙනුවට විකල්පයක් වශයෙන් කෝපි වතු වගාවට යොමු වීම.
- එඩ්වඩ් බාන්ස් ආණ්ඩුකාරවරයා ගන්නෝරුවේ සහ ජෝර්ජ් බර්ඩ් විසින් ගම්පොළ සිංහපිටියේ කෝපි වගාව අත්හදා බැලීමෙන් පසු උඩරට ප්‍රදේශ වල කෝපි වගාව සාර්ථකව කළ හැකි බව අවබෝධ වීම.
- බාන්ස් ආණ්ඩුකාරවරයා කෝපි වගාව දියුණු කිරීම උදෙසා ව්‍යාපාරිකයන් ධෛර්යමත් කිරීමට කටයුතු කිරීම. වගා කරුවන්ට ණය පහසුකම්, අපනයන පහසුකම්, බදු සහන ලබා දීම, ශ්‍රමය පහසුවෙන් ලබා ගැනීමට වතුවල සේවයට යන්නවුන් අනිවාර්ය සේවා රාජකාරියෙන් නිදහස් කිරීම.
- උඩරට කොළඹ මහා මාර්ග පද්ධතිය දියුණු කොට ප්‍රවාහන පහසුකම් වැඩි කිරීම වැනි කටයුතු සිදු කිරීම. හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයා විසින් කොළඹ නුවර දුම්රිය ධාවනය ආරම්භ කිරීම නිසා ප්‍රවාහන කටයුතු ලාබදායීව හා කාර්යක්ෂමව සිදු කරගත හැකි වීම.
- කෝල්බෘක් යෝජනා මගින් සිවිල් සේවකයන්ට වැවිලි කර්මාන්තයේ නියැලීමට අවසර ලබා දීම නිසා ඔවුන් කොපි වගාවට යොමු වීම.
- 1840 අංක 12 දරණ ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනත මගින් ස්වදේශිකයන් සතු ලිඛිත අයිතිය ඔප්පු කිරීමට නොහැකි ඉඩම් රජයට පවරාගෙන ඉතා සුළු මුදලකට ඒවා වැවිලි කරුවන්ට ලබා දීම.
- ලන්ඩන් වෙළඳපොලේ ලංකාවේ කෝපි වලට දැඩි ඉල්ලුමක් පැවතීම.
- දකුණු ඉන්දියානු ද්‍රවිඩ කම්කරුවන් ගෙන්වා ඔවුන්ගේ ශ්‍රමය අඩු මුදලකට ලබා ගැනීමට හැකි වීම නිසා ව්‍යාපාරිකයන්ගේ ලාභය වැඩි වීම වැනි හේතු නිසා කෝපි වගාව දියුණු වීම.
- මෙසේ දියුණුවට පත් වූ කෝපි වගාව තාවකාලික පරිහානියට පත් වීමට නිශ්පාදන වියදම් ඉහළ යාම, එංගලන්තයේ ඇති වූ ආර්ථික පරිහානිය නිසා කෝපි ඉල්ලුම අඩු වීම, වෙනත් රටවලින් කෝපි සැපයීම වැඩි වීම නිසා මිල පහළ වැටීම ආදිය බලපෑ බව.
- 1851 - 1868 කාල සීමාව තුළ නැවත කෝපි වල මිල ගණන් වැඩි වන්නට පටන් ගැනීම නිසා කෝපි වගාව වර්ධනය වීම.
- නමුත් 1868 න් පසු ලංකාවේ කෝපි වතුවල හැමිලියා වැස්ට්‍රාටික්ස් නැමති දිලීර රෝගය පැතිර යාම නිසා කෝපි මුළුමනින්ම විනාශ වීම.

**iii)** ඩොනමෝර් ආණ්ඩුක්‍රමය

- පැවති ආණ්ඩුක්‍රමයේ එනම් 1924 මැනිං - ඩෙවොන්ෂයර් ආණ්ඩුක්‍රමයේ අඩුපාඩු පරීක්ෂා කොට යෝජනා ඉදිරිපත් කිරීම සඳහා ඩොනමෝර් කොමිෂන් සභාව 1927 දී මෙරටට පත්කොට එවනු ලැබීම.එම කොමිසම විසින් යෝජනා කොට පසුව ක්‍රියාත්මක කරන ලද ආණ්ඩුක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණ වශයෙන් පහත සඳහන් කරුණු ගෙනහැර දක්වා තිබීම වැදගත් වේ.

- සර්වජන ඡන්ද බලය.
    - ❖ මෙතෙක් ඡන්ද බලය හිමි වුනේ මුළු ජන ගහනයෙන් 4% කට පමණි. කොමිසම මඟින් සර්වජන ඡන්ද බලය ප්‍රධානය කිරීමට කළ යෝජනාවට ඒ.ඊ.ගුණසිංහ හැරුණු විට සෙසු ජාතික නායකයන් සියලු දෙනාම පාහේ විරුද්ධ වූවත් එය සම්මත විය. යුරෝපා නොවන ජනතාවක් අතර සර්වජන ඡන්ද බලය හිමි පළමු බ්‍රිතාන්‍ය යටත් විජිතය බවට ලංකාව පත් විය.
    - ❖ මෙමඟින් ජාතිමූල නියෝජනය අහෝසි කිරීම.
    - ❖ වයස අවුරුදු 21ට ඉහළ සෑම කෙනෙකුටම ඡන්ද බලය හිමි වීම. මුලදී ස්ත්‍රීන්ට වයස අවුරුදු 30ත් පුරුෂයින්ට වයස අවුරුදු 21ත් ලෙස තීරණය කර තිබුණත් පසුව වසය අවුරුදු 21ට වැඩි සියලු දෙනාට ඡන්ද බලය හිමි විය.
- ආණ්ඩුකාරයා
    - ❖ ආණ්ඩුකරු සතු බලතල සීමා සහිත වීම. තමා ගනු ලබන තීන්දු තීරණ සෑම විටම යටත් විජිත භාර මහලේකම්ට වාර්තා කළ යුතු වීම.
    - ❖ ආණ්ඩුකාරයාගේ වගකීම වූයේ ව්‍යවස්ථාදායක හෝ අමාත්‍ය මණ්ඩලය විසින් අනුගමනය කරනු ලබන ඉක්මන් හෝ අපරික්ෂාකාරී ක්‍රියා වැළැක්වීමයි.
- ආණ්ඩුකාරයා සතු බලතල
    - ❖ රාජ්‍ය මණ්ත්‍රණ සභාව ඇමතීමේ බලය.
    - ❖ රාජ්‍ය මණ්ත්‍රණ සභාව සම්මත කරනු ලබන පනත සම්බන්ධයෙන් කිහිප ආකාරයකින් ක්‍රියා කිරීමට තිබූ බලතල.
    - ❖ එක එල්ලේම එකඟ වීම
    - ❖ මහරජතුමාගේ අනුමැතිය ලැබෙන තෙක් ඊට එකඟ නොවීම
    - ❖ සංශෝධන සහිතව හෝ රහිතව හෝ රාජ්‍ය මණ්ත්‍රණ සභාව වෙත යලිත් ෂලකා බැලීම සඳහා යොමු කිරීම
    - ❖ වැදගත් ප්‍රතිපත්තිමය ප්‍රශ්නයක් අඩංගු පනත් නම් එය සහතික කොට පසුව නීතිගත කිරීම සඳහා මණ්ත්‍රණ සභාවේ 2/3 ක ඡන්දය ඉල්ලා සිටීම
    - ❖ එකඟ වූවත් එය ක්‍රියාවේ යෙදවීම හයමසකට කල්තැබීම මුළුමනින්ම ප්‍රතික්ෂේප කිරීම
- හදිසි අවස්ථාවකදී හෝ එබඳු අවස්ථාවකදී පැනනැගී ඇතැයි හැඟෙන අවස්ථාවකදී ඕනෑම දෙපාර්තමේන්තුවක පාලනය සියතට ගැනීම.
- රාජ්‍ය සේවාවේ සේවකයින් පත් කිරීම, මාරු කිරීම, අස් කිරීම හා ඔවුන් සම්බන්ධ විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම.
- රාජ්‍ය මණ්ත්‍රණ සභාව
    - ❖ මෙතෙක් පැවති ව්‍යවස්ථාදායක හා විධායක සභා වෙනුවට ඇතිකළ රාජ්‍ය මණ්ත්‍රණ සභාව සාමාජිකයන් 61 දෙනෙකුගෙන් සමන්විත වීම.
    - ❖ ප්‍රදේශ මූල ඡන්දයෙන් පත්කළ 50 දෙනා සුළු ජාතික නියෝජනය සඳහා නාමකරණයෙන් පත්කළ 8 දෙනා මෙන්ම නීති ලේකම් රාජ්‍ය ලේකම් යන රාජ්‍ය නිලධාරින් තිදෙනාගෙන් සංයුක්ත වීම.
    - ❖ බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලයේ කටයුතු සිදු වූ ආකාරයට මෙහි කටයුතු ද සිදු විය.
    - ❖ මණ්ත්‍රණ සභාව ෂතු විධායක බලය ක්‍රියාත්මක වූයේ විධායක කාරක සභා මඟිනි.

- විධායක කාරක සභා ක්‍රමය හා අමාත්‍ය මණ්ඩලය.
    - ❖ විධායක කාරක සභා 07ක් පිහිටුවීය.ඒවා නම්,
        - ➢ ස්වදේශීය කටයුතු
        - ➢ කෘෂිකර්මය
        - ➢ පළාත් පාලනය
        - ➢ සෞඛ්‍ය
        - ➢ කම්කරු කර්මාන්ත හා වෙළඳ කටයුතු
        - ➢ අධ්‍යාපනය
        - ➢ සන්නිවේදන ගමනාගමනය හා ප්‍රසිද්ධ වැඩ

- විධායක කාරක සභාවක සාමාජික සංඛ්‍යාව 08 කට නොවැඩි 05 කට නොඅඩු වීම.
- අමාත්‍ය මණ්ඩලය සකස් වී තිබුණේ මෙම විධායක කාරක සභා හතේ ප්‍රධානීන්ගෙන් සහ නීති ලේකම්, රාජ්‍ය ලේකම්, මුදල් ලේකම් යන රාජ්‍ය නිලධාරින් තිදෙනාගෙනි.

**iv)** දහනව වන සියවසේ දෙවන භාගයේ ඇතිවූ බෞද්ධ පුනර්ජීවය

- ආරම්භය - ක්‍රිස්තියානි මිෂනාරි වරුන්ගේ ආගමික ප්‍රචාරක කටයුතු හා බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ප්‍රතිපත්ති වලින් බෞද්ධ ආගමට එල්ලවූ අභියෝග හේතු කොට ගෙන ඊට ප්‍රතික්‍රියාවක් ලෙස ආරම්භ වීම.
- ගොගර්ලි වැනි පූජකයන් බෞද්ධාගම විවේචනය කිරීම හා බෞද්ධ නායකයන් ඊට ප්‍රතිචාර දැක්වීමට ඉදිරිපත් වීම.
- මෙම ප්‍රතිචාරයෙ කූඨප්‍රාප්තිය සලකුණු කරන ක්‍රියාකාරකම් අතර මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි සහභාගී වූ පානදුරාවාදය වැදගත්.
- එම වාදයට ඇමරිකාව තුළ ලැබුණු ප්‍රසිද්ධිය හේතු කොටගෙන පරමවිඥාර්ථවාදීන්ගේ අවධානය ලංකාව කෙරෙහි යොමු වීම.
- ඕල්කට් තුමා සහ බ්ලැවැස්කි මැතිණිය මෙරටට පැමිණිම. මෙරට පරම විඥාර්ථ සංගමය පිහිටුවීම හා බෞද්ධ අධ්‍යාපනයේ අභිවෘද්ධිය සඳහා එම සංගමය ඉදිරිපත් වීම.
- පිරිවෙන් අධ්‍යාපනයේ පුනර්ජීවය ඇති වීම.
  1873 මාලිගාකන්ද විද්‍යෝදය පිරිවෙන සහ 1875 පැලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන පිහිටුවීම. මේවා ප්‍රාචීන අධ්‍යනය පිළිබඳ උගතුන් බිහි කරන මධ්‍යස්ථාන බවට පත් වීම.
- බෞද්ධයන් වෙනුවෙන් යම් යම් අයිතිවාසිකම් දිනා ගැනීම.
  බෞද්ධ කොඩිය , වෙසක් නිවාඩු දිනය
- බෞද්ධ ලිපි හා පොත්පත් පළ කරන මුද්‍රණාල බිහිවීම හා එමඟින් බෞද්ධාගම ප්‍රචාරය කිරීම හා බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ ඇතැම් ප්‍රතිපත්ති විවේචනය කිරිම.
- නව වෙහෙර විහාර ඉදිවීම හා ථූපාරාමය, රුවන්වැලිසෑය වැනි ඓතිහාසික බෞද්ධ ස්මාරක ප්‍රතිසංස්කරණය කිරීම.